# සිංහල සදුපදේශ කාව්‍ය වල ඇති සාහිත්‍යය වටිනාකම පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක්

***Sadeeka Farween***

***Department of Languages***

***Faculty of Arts & Culture***

***SEUSL***

***Sadeekahameed@gmail.com***

***ABSTRACT:***

*යමක් කළ යුතු නියම පිළිවෙල ගැන දෙන ගුරුහරුකම් කළ යුතු දේ තේරුම් කර දීම අවවාදය අනුශාසනය උපාය උපදේශය යනුවෙන් ගම්‍යවෙයි. යහපත් දෙයක් පෙන්වාදීම, දැක්වීම, උපදෙස් දීම, අවවාද කිරීම යන අදහස් ගැබ්ව පවතින්නක් ලෙස උපදේශය නොහොත් සදුපදේශ පෙන්වා දිය හැකිය. පුද්ගලයකු හෝ සමාජ සංස්ථාවක් හෝ මුළු මහත් සමාජයම ඉහළ පුරුෂාර්ථ කරා යොමු කිරීම සඳහා අර්ථයක් ධ්වනිත වන සේ ඉදිරිපත් කර ඇති නිර්මාණ උපදේශ ගණයට ඇතුළත් වෙයි. මේවායේ සමාජය සුචරිතයට නැඹුරු කරවන උපදේශයක් අන්තර්ගත වීම මෙහි විශේෂ ලක්‍ෂණයයි. මෙයින් අදහස් වන්නේ ශිෂ්ට සම්මත ජීවිතයේ ඉදිරි ගමනට නැතහොත් අභිවෘද්ධියට තුඩුදෙන චාරිත්‍ර විධින් ඔප කෙරෙන බුද්ධිමත් අනුශාසනය උපදේශය වශයෙන් සැලකිය හැකිය. සාහිත්‍යයේ පරමාර්ථය උපදෙස් දීම නොවෙතත් සෑම උසස් සාහිත්‍ය කෘතියකින්ම කිසියම් උපදේශයක් හෝ ආදර්ශයක් ලැබිය හැකි බව පිළිගත් අදහසකි. අද්‍යතන සාහිත්‍යයේ පවා උපදේශාත්මක අගය ඉස්මතු වී පෙනෙයි. මෙම උපදෙස් අතර අධික තෘෂ්ණාව කාමුකත්වය මධ්‍යපානය පොරොන්දු කඩකිරීම බොරුකිරීම, ආත්ම වර්ණනය, අනුන් හෙළා දැකීම, යුතුකම් පැහැර හැරීම, පරපණ නැසීම, වංචා කිරීම, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, මානය, අහංකාරකම, අලසබව, කම්මැලිකම, අසත්පුරුෂ සේවනය වැනි කායික වාචසික මානසික දුර්ගුණ වලින් ඉවත්ව සත්‍යවචන කීම, මෛත්‍රීය, අනුකම්පාව, ආගන්තුක සත්කාරය, පරෝපකාරය, කළගුණ සැලකීම, මව්පිය උපස්ථානය, නොපසුබස්නා උත්සාහය, නිරභීතකම, සත්පුරුෂ ආශ්‍රය ආදී සුචරිත ධර්මයන්හි උදාරත්වය ඉන්ද්‍රිය දමනය, චිත්ත පාරිශුද්ධිය, අපිස් බව ආදී ලොව්තුරු ධර්මයෙහී උතුම්බව පිළිබඳ නොඅඩුව උපදෙස් දෙයි.මෙම අධ්‍යනය තුළින් බලාපොරොත්තු වන්නේ සිංහල සදුපදේශ කාව්‍ය වල සාහිත්‍යය වටිනාකමක් තිබෙන්නේ ද යන්න පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක් සිදු කිරීමටය. මෙම අධ්‍යනය ප්‍රධාන වශයෙන් ද්වතීක දත්ත පාදක කොට ගෙන ඇත.*

***KEY WORDS:***

*උපදේශය, ශිෂ්ට, සාහිත්‍යය, කාව්‍ය, සිංහල*

**RESEARCH PROBLEM:**

සිංහල සදුපදේශ කාව්‍ය වල සාහිත්‍යය වටිනාකමක් තිබෙන්නේ ද යන්න පිළිබඳ සාකච්ඡා කිරීම මෙම අධ්‍යනයේ පර්යේෂණ ගැටළුව ලෙස දැක්විය හැක.

**RESEARCH OBJECTIVE:**

සිංහල සදුපදේශ කාව්‍ය වල සාහිත්‍යය වටිනාකමක හා එහි සාමාජයීය වටිනාකමක පෙන්වා දීමටය.

**RESEARCH METHODOLOGY:**

මෙම අධ්‍යනය ප්‍රධාන වශයෙන් පොත්,ලිපි,සඟරා,අන්තර්ජාලය යන ද්වතීක දත්ත පාදක කොට ගෙන ඇත.

## INTRODUCTION:

යමක් කළ යුතු නියම පිළිවෙල ගැන දෙන ගුරුහරුකම් කළ යුතු දේ තේරුම් කර දීම අවවාදය අනුශාසනය උපාය උපදේශය යනුවෙන් ගම්‍යවෙයි. යහපත් දෙයක් පෙන්වාදීම, දැක්වීම, උපදෙස් දීම, අවවාද කිරීම යන අදහස් ගැබ්ව පවතින්නක් ලෙස උපදේශය නොහොත් සදුපදේශ පෙන්වා දිය හැකිය. සිංහල වහරෙහි විවිධ අර්ථ දැක්විය හැකි උපදේශය යන වදන පාලි භාෂාවේ උපදේසනය යන පුරුෂ



ISBN 978-955-627-120-1

ලිංගික පදයෙන් ''පාරම්පරීය ඓතීයං උපදේසො ඉතීහ'' යනුවෙන් විග්‍රහ කෙරෙයි. ඉංග්‍රීසි භාෂාවේ Didactle, Preceptive, Advisery, Admoitory වදන් වලින් උපදේශ යන අර්ථ දෙයි. පුද්ගලයකු හෝ සමාජ සංස්ථාවක් හෝ මුළු මහත් සමාජයම ඉහළ පුරුෂාර්ථ කරා යොමු කිරීම සඳහා අර්ථයක් ධ්වනිත වන සේ ඉදිරිපත් කර ඇති නිර්මාණ උපදේශ ගණයට ඇතුළත් වෙයි. මේවායේ සමාජය සුචරිතයට නැඹුරු කරවන උපදේශයක් අන්තර්ගත වීම මෙහි විශේෂ ලක්‍ෂණයයි. මෙයින් අදහස් වන්නේ ශිෂ්ට සම්මත ජීවිතයේ ඉදිරි ගමනට නැතහොත් අභිවෘද්ධියට තුඩුදෙන චාරිත්‍ර විධින් ඔප කෙරෙන බුද්ධිමත් අනුශාසනය උපදේශය වශයෙන් සැලකිය හැකිය.

සාහිත්‍යයේ පරමාර්ථය උපදෙස් දීම නොවෙතත් සෑම උසස් සාහිත්‍ය කෘතියකින්ම කිසියම් උපදේශයක් හෝ ආදර්ශයක් ලැබිය හැකි බව පිළිගත් අදහසකි. අද්‍යතන සාහිත්‍යයේ පවා උපදේශාත්මක අගය ඉස්මතු වී පෙනෙයි. ඒ අතර උපදේශයම අරමුණු කරගත් කෘති රාශියක් පෙරදිග විශේෂයෙන්ම භාරතීය සාහිත්‍යයෙන් හමුවේ. මෙම ග්‍රනථ බහුල වශයෙන් පද්‍ය ග්‍රනථය, උපදේශ, නීති, ලෝකනීති, සදුක්ති, සුභාෂිත යන නම් මෙම කෘති සඳහා සංස්කෘති භාෂා සාහිත්‍යයේ යෙදේ. චානක්‍ය නීතිසාර, නීතිශතක, සදුක්ති කර්ණාමෘත, සුභාෂිතාවලී භාරතීය සාහිත්‍යයෙන් හමුවන පුරාතන්‍ය උපදේශ කාව්‍ය කිහිපයකි. හිසෝයිඩ් සාහිත්‍යයෙන් හමුවන පුරාතන උපදේශ කාව්‍ය කිහිපයකි. හිසෝයිඩ් Hesold පිනෝමිනා Phenomena රේරම් නැචුරා De Rerum Natura බටහිර සාහිත්‍යයෙන් හමුවන උපදේශ ග්‍රනථ කිහිපයකි. තිරුක්කුරල්, නාළඩියාර්, තාණමණික්කෝවෙ, අසාරක්කොවෙ, තිරුතට්කම්, සිරුපංචමුලම් මුදුරෙ ද්‍රවිඩ උපදේශ ග්‍රනථ කිහිපයකි. සිංහල උපදේශ පද්‍ය කාව්‍ය අතර ලෝවැඩ සඟරාව, ලෝකෝපකාරය, සුභාෂිතය ප්‍රධාන වෙයි.ත්‍රිපිටක ධර්මයෙන් පෝෂණය වූ පාලි සාහිත්‍ය උපදේශ මඤ්ජුසාවක් බඳුය. පාලි බෞද්ධ සාහිත්‍යයේ දැකිය හැකි ඉහළම උපදේශ ග්‍රනථය ධම්මපදයයි. මේ හැරුණු විට ජාතක ථෙරගාථා, ථේරීගාථා උපදේශ ගුණයෙන් පොහොසත්ය. පසුකලෙක රචිත සද්ධම්මොපායතනය සිංහල සාහිත්‍ය කෙරෙහි විශේෂයෙන් බලපා ඇති පාලි උපදේශ ග්‍රනථයකි. බුදුසිරිත හා ධර්මය් වස්තු විෂය කරගෙන පෝෂණය වූ සිංහල සාහිත්‍යයේ සදාචාරත්මක හා ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා උපදේශ නමින් වෙනම සාහිත්‍ය අංශයක් අවශ්‍ය නොවීය.

**RESULTS AND DISCUSSION:**

''උපදේශය අවශ්‍යයෙන්ම සාහිත්‍යයේ අංගයක් විය යුතුය'' යන්න ආරම්භයේ සිටම භාරතීය සාහිත්‍යධරයන් පිළිගත් සම්මතයක පිහිටා සිටි බව පෙනේ. සංස්කෘති අලංකාරවාදීන් විසින් උපදේශ සාහිත්‍යයේ එක් පරමාර්ථයක් විය යුතු යයි ගොඩනැගූ සිද්ධාන්ත සංස්කෘති සාහිත්‍ය කෙරෙහි පමණක් නොව වෙනත් භාෂා සාහිත්‍ය කෙරෙහි ද එකසේ බලපා ඇති බව පෙනේ. ජෛනයන් (අර්ධ මාගධියෙන්) ප්‍රාකෘත භාෂාවෙන් ද බෞද්ධයන් මගධ භාෂාවෙන් ද ද්‍රවිඩයන් ද්‍රවිඩ භාෂාවෙන් ද රචිත උපදේශ කාව්‍ය ග්‍රන්ථ රැසක් බිහිවූයේ මේ නිසා විය යුතුය.සියබස්ලකරෙහි දැක්වෙන ආකාරයට පෙදෙන් බුදුසිරිත බසින් වත් සිරිත් ඈ යන සම්මතයෙහි පිහිටි සිංහල සාහිත්‍යධරයෝ ත්‍රිපිටක සාහිත්‍යයේ එන කතා පුවත් වස්තු විෂය කරගෙන කරන ලද උසස් සාහිත්‍ය ග්‍රනථ ධර්මෝපදේශ වලින් ගහනය. මෙම හේතුවෙන් පැරණි සිංහල බෞද්ධ ජනතාවගේ ආකල්ප සංවර්ධනය වූවා පමණක් නොව ඊට අනුකූලව ආචාර සමාචාර සමඟ ජීවන රටාව සමාජ චර්යා හැඩගැසී විකාශයට පත්වූයේය. මේ නිසාම අද්විතීය සංස්කෘතික උරුමයකට අයිතිවාසිකම් කීමට සිංහල බෞද්ධ ජනතාවට හැකි විය. බෞද්ධ සංස්කෘතික දායාදයෙන් සංවර්ධිත සමාජ සංස්කෘතිය විවිධ හේතු සාධක මත කුරුණෑගල ගම්පල රාජ්‍ය යුගයන්හි දි ක්‍රමයෙන් පරිහානියට පත්වයේය. මෙම කාලය තුළ හිස එසවූ හිනදු බලවේගයත් අනතුරුවූ කෝට්ටේ රාජ්‍ය සමයෙහි එල්ල වු බටහිර සංක්‍රමණ හා ආක්‍රමණ ක්‍රිස්තියානි කතෝලික ආගමික බලවේග හේතුවෙන් සිංහල බෞද්ධ සමාජය සෑම අංශයකිනම ක්‍රමයෙන් පරිහානියට පත්වු බව් දක්නට ලැබේ. ක්‍රමික සමාජ පරිහානිය පිටුදැකීම සඳහා මෙවක සාහිත්‍ය පෝෂණය කළ සාහිත්‍යධරයෝ එතෙක් සිංහල සාහිත්‍යයට ආගන්තුක වූ වෙනත් සාහිත්‍ය මාධ්‍යය කෙරෙහි අවධානය යොමු කළහ.

සිංහල ගද්‍යයෙන් හා සිව්පද කාව්‍යයෙන් මෙන්ම ගීතයෙන්, රචනා කර ඇති උපදේශ කාව්‍ය ග්‍රන්ථ හැරුණු විට පැරණි පන්සල් අධ්‍යාපනය සඳහා නියමිත පොත් පෙළට ඇතුළත් කර ඇති සංස්කෘත පොතපතින් උපුටාගෙන සකස් කළ ප්‍රත්‍යශතකය, ව්‍යාසකාරය ඇතුළු ශතක පොත් ගණනාවක් වෙති.



ISBN 978-955-627-120-1

මෙම ශතක ග්‍රන්ථවල විවිධ විෂයන් ගැන ලියවී ඇති අතර, උපදේශයෙන්ම ඉදිරිපත් කරන කෘති කිහිපයක් වෙයි. මේවායේ පුද්ගලයා හා සමාජය යහමගට යොමු කරන බොහෝ උපදෙස් ඉදිරිපත් කර ඇත. මෙම උපදෙස් අතර අධික තෘෂ්ණාව කාමුකත්වය මධ්‍යපානය පොරොන්දු කඩකිරීම බොරුකිරීම, ආත්ම වර්ණනය, අනුන් හෙළා දැකීම, යුතුකම් පැහැර හැරීම, පරපණ නැසීම, වංචා කිරීම, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, මානය, අහංකාරකම, අලසබව, කම්මැලිකම, අසත්පුරුෂ සේවනය වැනි කායික වාචසික මානසික දුර්ගුණ වලින් ඉවත්ව සත්‍යවචන කීම, මෛත්‍රිය, අනුකම්පාව, ආගන්තුක සත්කාරය, පරෝපකාරය, කළගුණ සැලකීම, මව්පිය උපස්ථානය, නොපසුබස්නා උත්සාහය, නිරභීතකම, සත්පුරුෂ ආශ්‍රය ආදී සුචරිත ධර්මයන්හි උදාරත්වය ඉන්ද්‍රිය දමනය, චිත්ත පාරිශුද්ධිය, අපිසබව ආදී ලොව්තුරු ධර්මයෙහි උතුම්බව පිළිබඳ නොඅඩුව උපදෙස් දෙයි.සිංහල උපදේශ සාහිත්‍ය ඉතිහාසය තහවුරු වීම යන කරුණු සලකා යුග 03 කට වෙන්කර තිබේ.

- ශාස්ත්‍රය සාහිත්‍ය කෘති තුළ ඇති උපදේශ ලක්‍ෂණ.
- ශාස්ත්‍රීය උපදේශ සාහිත්‍යය.
- ජන උපදේශ සාහිත්‍යය.

සාහිත්‍යයේ අරමුණු පරමාර්ථ නිශ්චිත වශයෙන් කීම දුෂ්කරය. සමාජ යථාර්ථය පෙන්වා දී ඒතුළන් මනුෂ්‍යය ජීවිතය යහපත් කිරීමට ගන්නා උත්සහයක් ලෙස දැක්විය හැක. පැරණි ගද්‍ය පද්‍ය සාහිත්‍ය කෘති පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ඉහතින් පැවසූ පරිදි එම ඉපැයේ. සිංහල පොත ධර්ම උපදේශයන්ගෙන් සමන්විතව පැවතුණි. එය විදහා දක්වන නිදසුන් කිහිපයක් දක්වා ඇත. පහත ආකාරයට ධර්මෝපදේශයන් සපයා ඇත.

**''තුන්ලෙව්හි සැරිසැරූ විෂම පුරුෂයන් දමා අමා මහ නිවන් පැමිණ වූ සේ, හුදී ජනයන් සඳහා සිය බසින් මා විසින් සැකෙවින් දක්වනු ලැබේ.''**

**(අමාවතුර)**

**''මෙසේ හික්ම විය යුත්තන් හික්මවා අමා මහ නිවන් ලන සේ දන්නා මාගේ ස්වාමි දරුවාණන් සරණ සෙවිය යුතු යැයි බුත්සරණ යා යුතු''**

**(බුත්සරණ)**

**''සත්පුරුෂයන් විසින් හැම වෙලේම මේ බණ සිත තබා තුන් දොරින් සිද්ධ වන අකුසලින් දුරුවැ කුසල් පුරා ලොව් ලොව්තුරා සැපත් නිරායාසයෙන් සිද්ධ කටයුතු.''**

**(සද්ධර්මරත්නාවලිය)**

**තවද කල්‍යාණ පෘථග්ජන ශ්‍රද්ධාවත් වූ අක්ෂරභ්‍යාසය ඇති සත්පුරුෂයන් සාවද්‍ය වූ කර්මාන්තයන් හැර නිරවද්‍ය වූ ධර්මයන් ආත්මාර්ථ පරාර්ථ සාදාගනුම්හයි සිතා නිරවද්‍ය ජීවිකායෙන් ඒ ඒ තන්හි ධර්මදානාදි ලෝවැඩ කරනුයේ සත්වනවු ලෝවැඩෙකැයි කියම්.''**

**(පූජාවලිය)**

ගුත්තිල කාව්‍යයේ ද මෙබඳු උපදේශයන් දැකගත හැකි වේ. මෙබඳු සාහිත්‍ය කෘතින්ගෙන් පෝෂිත සිංහල සාහිත්‍ය ජීවනාවයෙන් යුක්තව ලෝකයාට යහපත සලසා දීම අරුමයක් නොවේ.

**දියෙහි යන          දණ්ඩට**
**පිහිටක් වෙතත් පෙර          සිට**
**දුදනන් හට          පිහිට**
**නොවවු යන බස සැබෑ කළේ මට.**

**කොපමණ ගුණ          කළත්**
**දුදනෝ නොවෙති          යහපත්**



ISBN 978-955-627-120-1

**කිරි දියෙහි දෙවියත්**
**අගුරු සුදුවන කලෙක් නම් නැත්**

**(ගුත්තිල කාව්‍යය, වෑත්තෑවේ හිමි)**

ගුත්තිල කාව්‍යයේ එන මෙබදු උපදෙස් පිරිපුන් බවින් යුක්ත වීම නිසාම ජනතාව අතර කතා බහට ලක්වූ අයුරු දැකගත හැකි වේ.

කෝට්ටේ යුගයේ තවත් උපදේශ සාහිත්‍ය කාව්‍ය ග්‍රන්ථයක් ලෙස විදාගම හිමිගේ බුදුගුණඅලංකාරය පෙන්වා දිය හැක. ඒ තුළ බුදු ගුණ වැඩෙන අතර, එහි උපහාසාත්මකව උපදෙස් දී ඇත.

**රජුන් අදමිටු වෙත් - වෙති මැතිදෝද එපවත්**
**දැක උන්ගේ පුවත් - බමුණ යහපතියෝ ද එගනික්**
**මුනගෙන් වෙති සෙත් - කරන පුද මේ ලෙව්සෙත**
**වැලි මළු ලා සහන - වඩින වැනි තෙල් පතා නොලියන.**

**(බුදුගුණ අලංකාරය, විදාගම හිමි)**

දහම ඇසුරු කොට ගනිමින් ගුණ දහම් වර්ධනය උදෙසා බොහෝ සෙයින් උපකාරී වන මෙබදු උපදේශ කාව්‍යයන් කෙරෙහි ජනතාව ඇලුම් කිරීමට පටන් ගත්හ. එම හේතුව නිසා සාහිත්‍ය වර්ධනයත්, සමාජ ප්‍රගතියක් හොඳින් ඉටු වී ඇති අයුරු දැකගත හැකි වේ. ශාස්ත්‍රය කෘතින්හි ඇති උපදේශ ලක්‍ෂණ මෙසේ ප්‍රකට වන අතර, මෙම පූර්ව සාහිත්‍යය උපයෝගී කරගනිමින් එම සාහිත්‍ය පසුබිම් කරගනිමින් ශාස්ත්‍රිය උපදේශ කෘතින් බිහි වේ. සිදත් සඟරාවද සම්ප්‍රදාන විභක්තිය උගන්වන තැන සදුපදේශ සංකල්පය දක්නට ලැබේ.

**''උකටලියං දලැදිලි - දෙනු පිය සමාම්හි''**

**(සිදත් සඟරාව)**

ප්‍රිය සමාගමයෙන් පසු බිරිඳට පැන් දෝතක් පෙවිය යුතු බව මෙයින් කියවේ.

## ශාස්ත්‍රීය උපදේශ සාහිත්‍යය

ශාස්ත්‍රීය සාහිත්‍ය කෘතින්හි ඇති උපදේශ ලක්‍ෂණ පසුබිම් කරගනිමින් ශාස්ත්‍රීය උපදේශ කෘතින් පහළ වී ඇත. ලෝවැඩ සඟරාව, සුභාෂිතය, ලෝකෝපකාරය වැනි කෘතින් මෙහි දී වැදගත් වේ.

ලෝවැඩ සඟරාව ද විවිධ සාහිත්‍ය චින්තාවන්ට පසුබිම් වූ කෝට්ටේ යුගය උපදේශ සාහිත්‍යයේ දීප්තිමත් අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකිය. පළමු සිංහල උපදේශ කෘතිය වන ලෝවැඩ සඟරාව බිහි වී ඇත්තේ මෙකලය. විදාගම වෙහෙරේ වැඩ සිටි මෛත්‍රී මහ තෙරුන් මෙහි කතුවරයාණෝ වෙති. එතුමන්ගේ මෙම සේවය ප්‍රශස්තය. ලෝවැඩ යහපත උදෙසා මෙය ලියා ඇති අතර, එය පද්‍ය 139 කින් සමන්විතය. එය ලිවීමේ පරමාර්ථය උන්වහන්සේ මෙසේ දක්වයි.

**වෙසෙසින් පෙළදම් නොම දන් දන හ ට**
**පවසම් කළ කම් පල දැන් හෙළු කො ට**



ISBN 978-955-627-120-1

**(ලෝවැඩ සඟරාව)**

පාලි ධර්මය වටහාගත නොහැකි අයගේ පහසුව සඳහා බණ මග අනුගමනය කරමින් තම චින්තාවන් මෙහෙයවමින් පැවසු ජීවිතයක යහපැවැත්මට උපයෝගීකරුවන් මෙසේ දක්වයි.

**කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ**
**දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ**
**මෙදෙකිනි මෙසසර දුක් දුර ලන්නේ**
**සුදනෙහි කිම වීරිය නොකර න්නේ**

**(ලෝවැඩ සඟරාව)**

බුදු කෙනෙකුන් උපදින්නේ දීර්ඝ කලෙකින. මනුෂ්‍ය ආත්මභාවය ලබන්නේ ද දුකසේමය. මේ සංසාර දුක්බය දුරු කරන්නේ මේ කරුණු දෙකින්ය. එහෙයින් සාධු ජනයෙනි. මේ දෙක ලැබූ කාලයෙහි වීර්ය නොකරන්නේ කිම්ද?.

**ඉස ගිනි ගත්තකු එ ගති නිවන ලෙස**
**කුස ලට මදකුදු පමා නුවොත් මිස**
**මෙසසර අත්හැර නොයන මෙදුක් රැස**
**වෙසෙසින් නැත අත් හරිනා උප දෙස**

**(ලෝවැඩ සඟරාව)**

හිස ගිනි ගත්තකු නොපමවා ඒ ගින්න නිවා ගන්නා මෙන් කුසලට ඇසිල්ලක් වත් පමා නොවුනොත් මිස මේ සසරේ අත්හැර නොයන්නා වූ මේ දුක් සමූහය නැති කරන අන්‍ය උපදේශයක් ඒකාන්තයෙන්ම නැත්තේය. මෙවැනි බොහෝ සදුපදේශයන් ලෝවැඩ සඟරාව තුළ තිබේ. නමුත් මෙම උපදේශ බොහෝ සේ අදාළ වනුයේ ගිහි ජීවිතයට නොව ආගමික ජීවිකාව සඳහාය. මන්ද සාන්දෘෂ්ඨික සමාජයක් තුළ මෙවැනි සදුපදේශ පිළිපදිනි ජනයා අඩුය. යහපත් ජීවිතයකට අනුශාසනා කරන පාප ක්‍රියා කෙරේ බිය ඇති කරවන කතා ප්‍රවෘත්ති ගෙනහැර දක්වා ඇත. සරල බව, මට සිලිටි වාග් මාලාවකින් සබැඳ ඇති මෙම පද්‍ය පහසු විරිතෙන් ඉදිරිපත් කර ඇත. දක්වා ඇති උදාහරණ වලින් ඒ බව මොනවට පිළිබිඹු වේ.

ලෞකික සැප හැරගිය යුතු බව.

**කුමට ද කා බී නිති සැරසෙන් නේ**
**කොතන ද මේ කය අරගෙන යන් නේ**
**ඇම සඳ නොමැලිව පින්කර ගන් නේ**
**එම වද බව සයුරෙන් ගොඩලන් නේ**

**(ලෝවැඩ සඟරාව)**

පරාර්ථ සේවය අගය කළ යුතු බව.

**අත් වැඩ පර වැඩ සමව සිතන්නේ**
**මෙත් සිත සවි සහ කෙරෙහි කරන්නේ**



ISBN 978-955-627-120-1

**එක් බැරි කම් තොප සසර ගෙවන්නේ**
**සෙත් පුර සැප කෙලෙසක ද ලබන්නේ**

මෙසේ අලංකාර වලට ගැති නොවී මිනිස් සිත තුළ සංයමය ඇති කරවීමට උචිත මාධ්‍යයෙන් උපදේශ දෙන ලෝවැඩ සඟරාව බෞද්ධ අබෞද්ධ ජනයාගේ ආදර ගෞරවයට ලක්වූ බව රහසක් නොවේ.රටෙහි වරින් වර ඇති පරිහානි අවස්ථා සාහිත්‍ය කෙරෙහි ද බලපා ඇත. සීතාවක සමය එබඳු යුගයකි. අලගියවන්න මුකවෙටිතුමාගේ සුභාෂිතය 1611 දී පමණ රචිතය. මෙම නීති උපදේශ කෘතියක් ලෙස සුභාෂිතය සැලකේ. පද්‍ය 100 කින් යුක්තව ජනශ්‍රැතියේ එන අදහස් වලට ගරු කරමින් ජනතාවගේ ආදරයට ගෞරවයට හේතුවූ සුභාෂිතය ඉතා වටිනේය. එහි අන්තර්ගතය මිසදුටු දෙවියන් යැදුම අසාර්ථක බව, පින් කිරිමේ අගය, සුදන දුදන ගුණ, පබුදන ඇසුර, එසේ දිළිදු අය ප්‍රභූන් ඇසුරෙන් බබලවන ආකාරය, නිසසාට නිසි තැන හිමිවිය යුතු බව ඉතාමත් සරලව පද්‍යයට නගා ඇත.

**පහළ පොරණ ඉසිවර වුවෙකි මන නඳ**
**දෙමළ සකු මගධ නොහසල සතට දඳ**
**පුවල ගිනි සත ගතැ පද අරුත් ලෙඳ**
**සිහල බසින් සැකෙවින් කියමි හඳ බැඳ**

**(සුභාෂිතය)**

මුකවෙටිතුමා මෙම කෘතිය කෙරෙහි පෙළඹූ අදහස් මේ පද්‍යයෙන් හෙළි වේ. එහි අරුත වනුයේ දෙමළ සංස්කෘත මාගයා (පාලි) යන භාෂාවන් නුගත් මෝඩ ජනයා සඳහා පුරාණයේ සෘෂිවරයන්ගේ මුඛයෙන් ප්‍රකාශ වු සිත් තුටු කරවන මහ නීති පොතෙහි දැක්වෙන කරුණු අර්ථවත්ව සිංහල බසින් කෙටියෙන් කවියට නඟා කියමි යනුවෙනි.

**පිනමද පුතුන් සියයක් ලදුවත් නිස රූ**
**ගුණ නැන බෙලෙන් යුතු පුතුමය ඉතා ග රූ**
**එක පුන් සඳින් එළිවෙයි ලොව ඝන අඳු රූ**
**නෙක තරු රැසින් එලෙසට නොම වේය දු රූ**

**(සුභාෂිතය)**

පිනමද පුතුන් සීයක් ලැබුවත් ඉතා උතුම් නුවණින් යුතු පුතා වටිනේය. ලෝකයේ ඝන අඳුර එක් සඳින් බැබලේ. තරු රැසින් ඒ එළිය නොලැබේ.

මේ ආකාරයට

**කුළුණු ගුණෙන් යුතු උතුමන් සිත මහරු.......**
**කුරිරු ගොර සපුනගේ දළගෙයී විෂය ............**
**පරසිදු පබු දනන් සෙව් පමණින් මහරු ...........**
**අමිත ගුණ නුවණ යුතු උතුමෝ පබඳ ..............**

**(සුභාෂිතය)**



ISBN 978-955-627-120-1

ආදී කවි තුළින් සුභාෂිතයේ සදුපදේශ මනා සේ ගෙන හැර දැක්වීමේ වටිනාකම පෙන්වයි. සිංහල පූර්ව සාහිත්‍ය කෘති තුළින් පමණක් නොව අන්‍ය සාහිත්‍යන්ගෙන් ද සුභාෂිතය ආභාෂය ලබා ඇත සත්ව ලෝකයේ උදාහරණ ද තම පරිසරයේ ඇතැම් සිද්ධි මුල් කරගෙන උපමා දක්වමින් උපදේශ දීමට ගත් උත්සාහය ප්‍රශංසනීයයි. ලෝකෝපකාරය පෙර ලියවී තිබූ සුභාෂිතය වැනි උපදේශ කෘති වලින්, හිතෝපදේශ කෘතින්ගෙනුත්, ධම්මපද වැනි දහම් පොත් වලිනත් ද්‍රවිඩ සාහිත්‍යයෙනුත් ප්‍රයෝජනය ලබා ඇත  මේවා පොදු ජන රුචිය වැඩි කිරීමට හේතු විය. ජන උපදේශ සාහිත්‍යය ශාස්ත්‍රීය බවක් අවිද්‍යමාන, පොදු ජනයා සඳහා නිබන්ධිත උපදේශ කාව්‍ය පිළිබඳ මෙහි දී සලකා බලනු ලැබේ. වදන් කවි පොත - පුරාණ පන්සල් අධ්‍යාපන ක්‍රමය අනුව පළමුව සිංහල හෝඩිය නම් පොත, මගුල් ලකුණ, ගණදෙවි හෑල්ල, වදන් කවි පොත ලෙස ද අනතුරුව ගමාෂ්ගේ ශතකය පොත් කරවීම පිළිවෙලය. තෙරුවන් නමැදීම, ගුරුවරු නැමදීම, අධ්‍යාපන ක්‍රමයට මඟපෙන්වීම ආදී ලෙස ඉගෙනීමේ අගය ප්‍රකාශිත කවි උපදෙස් ලෙස සැලකිය හැකිය.

**තිබූ තැනක සොර සතුරන් ගත නොහෙනා**<br>
**එසැඩ මනා වත් වතුරෙන් වල නොයනා**<br>
**කෝප වුවත් රජ මැතිඳුන් ගත නොහෙනා**<br>
**උගත මනා ශිල්පමයි මතු රැකෙනා**

ජනකවි ආරෙන් කෙරෙන මේ උපදෙස් පොදු ජන සමාජය අගේ කරයි.

**අල්ලට සිගාවත් රස නැති කැවිලි කකා**<br>
**වල් කොළ බිම අතුට නිදි නොලැබ දුක් තකා**<br>
**කල්ගිය රෙදි වැරලි ඇඳ දැලි කුණෙන් වතා**<br>
**ඇල්මෙන් අකුරු උගනී ඉදිරි වැඩ තකා**

කෑම ගැන, නින්ද ගැන, රෙදි ගැන නොසිතා ඇල්මෙන් අකුරු ඉගෙන ගත යුතු බව මෙහි කියැවේ. මෙම කවියේ දැක්ම ලක්ෂ සංඛ්‍යාත උගතුන් බිහි කරන ලදී.

**කසයේ සැම්ටි වේලැවි කෝටු ගෙන අතේ**<br>
**ඇසයේ කඳුළු අකුරට ගිය කළණ ගතේ**<br>
**බසයේ මිහිර තෙපලති දෙගුරු සවනතේ**<br>
**දසයේ පසයේ ගෙඩි දෙති පිටට එක රතේ**

**වේවැල් කෝටු නාරං සියඹලා අතු**<br>
**කිතුල් පොල් ඉරටු වැල් කහඹිලියා අතු**<br>
**මෙහැම ඉපල් මගෙ දෑසට නොපෑ යුතු මතු**<br>
**පමා නොවී එම් අකුරට මෙයින් මතු**

**පොල් ඉරටේ අණ තදකර ගතිම්මා**<br>
**ඉන් බලමොල කමකට හිත නොයම්මා**<br>
**දැන් නිසලට ඉඳ අකුරුත් කියම්මා**<br>
**ඉන් අප දගගේක ලූ දෑය අම්මා**

**(වදන් කවි පොත)**



ISBN 978-955-627-120-1

මෙහි ඉගෙනීමේ අගය මෙන්ම 18 වන සියවසේ දරුවන් වේවැලට බියෙන් අකුරු කිරීමට ගිය ආකාරය නිරූපණය කෙරේ. මෙය ජන උපදේශ කාව්‍යයක් සේ හැඳින්වේ.

බවෝපකාරය සමුද්‍රඝෝෂ විරිතින් කවි 89 බැඳිව ඇති මෙහි කතෘ අඥාතයි. ක්‍රි.ව. 1779 දී පමණ ලිය වී ඇත. පින් එල පෙන්වා දහම් උපදෙස් දෙයි. පින් කිරීම, බණ ඇසීම, මව්පිය උවමැන ආදිය කෙරෙහි සිත යොමු කරවන බැවින් උපදේශනාත්මක කෘතියක් සේ සැලකෙයි.

**නැණින් සොයා කළමුත් නිබඳව අදර**
**ඔවුන් කළ දේට බැරි කියනු සම කර**
**මෙයින් මතු දුකින් ගැලවෙන්නට සසර**
**බුදුන් වැනි සියලු සතහට දෙගුරු වර**

**(බවෝපකාරය)**

මේ දෙමාපිය අගය පවසන අයුරුයි. ලෝවැඩ සඟරාව වැනි පැරණි සාහිත්‍යයන් ඇසුරු කරගනිමින් මෙය රචනා කොට ඇත.

මිහිරිපැන්නේ ධම්මරතන හිමිගේ ප්‍රබන්ධ ද දීර්ඝ ප්‍රබන්ධ නොවුවත් බුද්ධස්තෝත්‍ර නම් පැදි 40 ක කෘතියක් ද, අපාදුක නම් පැදි 21ක කෘතියක් ද, තවත් කුඩා ප්‍රබන්ධ රාශියක් ද, මිහිරිපැන්නේ හිමි රචනා කොට ඇත.

**කරන කලට පව්කම් මේ වගෙයි මීරි වන්නේ**
**විඳින කලට දුක් නම් මේ රහේ වෙයි ලැබන්නේ**
**එදැන අකුසලින් වෙන් වී දහම් සේ බුදුන් නේ**
**නුවණ ඇති කෙනෙක් ඉන් පින්කමෙහි යෙදෙන්නේ**

**(අපාදුක)**

මෙයට ලෝවැඩ සඟරාවේ 37 පද්‍ය උපකාර වී ඇත. මෙහිමියෝ ශිෂ්‍යයෙකු වන කොග්ගල ධම්මතිලක හිමි ග්‍රන්ථ වශයෙන් පළ කළ ප්‍රබන්ධ නැත්ත වරින් වර ලියා ඇති ඇතැම් කවි ජන්ම උපදේශ ලෙස රසවත්ය.

**මග හොඳට තිබේ නම් යන්ට දෑසත පෙනේ නම්**
**කිම බැදිවල ය්නනේ මංමුලා වූ එකෙක් සේ**
**මිහිරි දිය තිබේ නම් පැන් කැමැත්තෙන් වී නම්**
**මිරිගුවට දුවන්නේ මක් නිසාදෝ මුවෙක් සේ**

මීට අමතරව ජන සාහිත්‍යයේ ද උපදේශ කාව්‍ය දක්නට ලැබේ.

**අඩහ කෑම දහස් වටී**
**නිදිමැරුවා දහස් වටී**
**ඇවිද්ද පය දහස් වටී**
**ඉවසු මලේ දහස් වටී**



ISBN 978-955-627-120-1

මෙය ජන කතාවක් ද ආශ්‍රයෙන් උපදෙස් දෙන්නකි.

**ළිඳක වතුර මට තනියම බොන්ට බැරි**
**ගසක දොඩම් මට තනියම කන්න බැරි**
**මලක සුවඳ මට තනියම විඳිනු බැරි**
**මගෙ ගුරුතුමා සිහිවන විට ඉන්න බැරි**

බෙදාහදා ගනිමින් කෑමට බීමට ගුරුවරයා කියා දී ඇති බැවින් ගුරුවරයා නිතරම මතකයට එනබව හැගේ. 18 වන සියවස අග භාගයේත්, 19 වන සියවස මුලදීත් පහළ වූ වියත් පරපුරේ කෘතීන් අතර උපදේශ කාව්‍යයන් බහුලය. තත්කාලීන සමාජ ප්‍රශ්න හමුවේ ඔවුන්ගේ කවීත්වය දියුණු වී සමාජය යහමගට ගැනීමට උත්සහ දරා ඇති අයුරු පෙනේ. ජීවිතයේ අයහපත් දේ අතහැර හොඳ ගුණ දම් සිරිත් විරිත් ප්‍රගුණ කරමින් ශ්‍රේෂ්ඨ සමාජයක් ගොඩනැංවීමෙහිලා උපදේශ කාව්‍යයක් පිටුවහලක් වන අයුරු දැකගත හැක.ලෝකෝපකාරය සිංහල උපදේශ සාහිත්‍යවලියෙහි එන විශාල කෘතිය මෙයයි. එලිසම කාව්‍ය බහුල යුගයක දී ගීයෙන් රචනා කොට තිබීම මෙහි ඇති විශේෂයකි. අදහස් නොපැකිලිව ප්‍රකාශ කිරිමට ගී පහසු මගක් වූවා විය හැකිය. ගී 238 කින් යුතු මෙහි කතුවරයා රණාග්ගල්ලේ හිමි බව ග්‍රනථයේම් සඳහන් වෙයි. මෙම කතුවරයා ක්‍රි.ව. 1799 දී පමණ තොටලමු වෙහෙර වැඩ සිට මේ කෘතිය කළ බව සඳහන් වේ. ඔවුන් මෙහි කතා කලාය පිළිබඳ මතභේද පවතී. මෙහි අන්තර්ගතය මුනදු ගුණ, පිනවි කිරීම, පින් බල, ඔවදන් පිළිවෙල, සුදන ගුණ, සුදන ඇසුරේ පල, උතුමන් ගති, දුදන ගති, මෝඩකම, දරු පෙම, සුරාදොස්, පව්කම්හි හැටි, ඉසුරුමත් බව, රාජගුණ, නැණබල, දෙගුරුන් නොරැකීම, නොසෙවිය යුතු දේ යනාදී කරුණු පිළිබඳ විවිධ උපදෙස් වලින් සමන්විතය. ඔවා දෙනු පරහට-තමා සම්මතෙහි පිහිටා සිට දුසිරිත දන්න දෙන - ඔවා වැද්දන් දෙසන බණ වැනි තමන් යහපත් ගුණ ධර්මයන්හි පිහිටා අන්‍යයන්ට අවවාද දෙන්න. නරක මිනිසන් දෙන්නා වූ අවවාද වැද්දන් බණ කියන්නාක් වැනිය.

ඉහත නිදසුන් වලට අමතරව කව්සිළුමිණෝ තවත් බොහෝ උපදේශයන් ඇත. එහි දී ඇමතිවරු විසින් පබවතියට දෙන උපදේශයන් ද දැකගත හැකි වේ. කුසරජු අතහැර නොයන ලෙසත්, ස්ත්‍රියකට තනිව ජීවත්වීම අපහසු බවත් පවසා ඇමතිවරු පබාවතියට උපදෙස් දෙයි. කව්සිළුමිණෝ උපදේශයන්හි ආකෘතියෙන් ලියා ඇති බැවින් සාමාන්‍ය ජනයාට එය ග්‍රහණය කර ගැනීම අපහසු වන්නට ඇත.

නමුත් කාව්‍යශේඛරයේ අවවාද ජනතාව තුළ කතාබහට ලක්වූ අයුරු දැකගත හැකි වේ. එයට හේතුව එය සිවුපදයෙන් දක්වා තිබීමයි.

**හිමි ගමනක් ගොසින්**
**ගෙට ආ කලට සතොසින්**
**නො ඇණවා දාසින්**
**නුඹම පය සෝදවන් විගසින්**

**නොකියා සිය හිමිට**
**නැතුව ද උතුරු සලු පොට**
**ගමන ඉක්මන් කොට**
**නොයන් නුඹ වසන ගෙන් පිටතට**

උක්ත නිදර්ශන තුළින් සිංහල සදුපදේශ කාව්‍ය වල ඇති සාහිත්‍යය වටිනාකම පෙනී යන අතර සමාජයට එම ලබා දෙන්නාවු උපදේශය ද පැහැදිලිය.



ISBN 978-955-627-120-1

## CONCLUSION:

18 වැනි සියවස අවසාන භාගයේත්, 19 වන සියවස මුල භාගයේත්, පහළ වූ වියත් කවි පරපුරේ ප්‍රබන්ධ අතර, ශ්‍රේෂ්ඨ උපදේශ බහුලය. සිංහල ගද්‍යයෙන් හා සිව්පද කාව්‍යයෙන් මෙන්ම ගීතයෙන්, රචනා කර ඇති උපදේශ කාව්‍ය ග්‍රන්ථ හැරුණු විට පැරණි පන්සල් අධ්‍යාපනය සඳහා නියමිත පොත් පෙළට ඇතුළත් කර ඇති සංස්කෘත පොතපතින් උපුටාගෙන සකස් කළ ප්‍රත්‍යශතකය, ව්‍යාසකාරය ඇතුළු ශතක පොත් ගණනාවක් වෙති. මෙම ශතක ග්‍රනථවල විවිධ විෂයන් ගැන ලියවී ඇති අතර, උපදේශයෙන්ම ඉදිරිපත් කරන කෘති කිහිපයක් වෙයි. මේවායේ පුද්ගලයා හා සමාජය යහමගට යොමු කරන බොහෝ උපදෙස් ඉදිරිපත් කර ඇත. මෙම උපදෙස් අතර අධික තෘෂ්ණාව කාමුකත්වය මධ්‍යපානය පොරොන්දු කඩකිරීම බොරුකිරීම, ආත්ම වර්ණනය, අනුන් හෙළා දැකීම, යුතුකම් පැහැර හැරීම, පරපණ නැසීම, වංචා කිරීම, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, මානය, අහංකාරකම, අලසබව, කම්මැලිකම, අසත්පුරුෂ සේවනය වැනි කායික වාචසික මානසික දුර්ගුණ වලින් ඉවත්ව සත්‍යවචන කීම, මෛත්‍රිය, අනුකම්පාව, ආගන්තුක සත්කාරය, පරෝපකාරය, කළගුණ සැලකීම, මව්පිය උපස්ථානය, නොපසුබස්නා උත්සාහය, නිරභීතකම, සත්පුරුෂ ආශ්‍රය ආදී සුචරිත ධර්මයන්හි උදාරත්වය ඉන්ද්‍රිය දමනය, චිත්ත පාරිශුද්ධිය, අපිසබව ආදී ලොවිතුරු ධර්මයෙහි උතුම්බව පිළිබඳ නොඅඩුව උපදෙස් දෙයි.තවද තත්කාලීන සාමාජික ප්‍රශ්න වල දී ඔවුනගේ කවීත්වය් තියුණු වී යාමෙන් සමාජයේ උන්නතිය ඇති වූ අයුරු ප්‍රශස්තය. ජීවිතයේ අගුණ වලකා, ගුණ දහම වහා වඩා, සිරිත් විරිත් පහදවා සංස්කෘතික රටාවක් තහවුරු කරවා ශ්‍රේෂ්ඨ සමාජයක් බවට පත් කරලීමට අමරණීය සේවයක් සලසාලන සාහිත්‍යයක් ලෙස උපදේශ සාහිත්‍යය පෙන්විය හැක.

## REFERENCE:


- අමරවංශ හිමි කොත්මලේ, **උපදේශ සාහිත්‍යය,**ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ,කොළඹ 10
- ධම්මතිලක හිමි පැලවත්තේ,**සිංහල උපදේශ සාහිත්‍යය**,ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ,කොළඹ 10,2006




ISBN 978-955-627-120-1